සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

## දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

## Second Term Test - Grade 9 - 2017

නම : ............................................... භූගෝල විද්‍යාව කාලය : පැය 02 යි.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) සූර්යයාගේ සිට පෘථිවියට ඇති දුර කිලෝමීටර මිලියන

(i) 147.2 කි. (ii) 152.1 කි.

(iii) 149.6 කි. (iv) 155.2 කි.

(02) කාලගුණයට හා දේශගුණයට අදාළ සංසිද්ධි රැසක්ම ක්‍රියාත්මක වන්නේ,

(i) පරිවර්ති ගෝලය තුළ ය. (ii) අපරිවර්ති ගෝලය තුළ ය.

(iii) මෙසෝ ගෝලය තුළ ය. (iv) තාප ගෝලය තුළ ය.

(03) ඉතා පැරණි පාෂාණ වලින් නිර්මිත ස්ථාවර භූ ස්කන්ධයක් වනුයේ මින් කුමක් ද?

(i) කඳුවැටි (ii) සානු

(iii) තැනිතලා (iv) පළිහ

(04) ආසියාව හා යුරෝපා මහද්වීප එකිනෙකින් වෙන් වෙන්නේ,

(i) හිමාල කඳු වැටියෙනි. (ii) යුරල් කඳු වැටියෙනි.

(iii) කොකේසස් කඳුවැටියෙනි. (iv) හින්දුකුෂ් කඳුවැටියෙනි.

(05) දකුණු ආසියානු කලාපය තුළ පිහිටි නිරන්තරයෙන් ගංවතුර උවදුරට මුහුණ දෙන රට වන්නේ මින් කුමක් ද?

(i) මාලදිවයින (ii) පාකිස්ථානය

(iii) නේපාලය (iv) බංගලාදේශය

- අංක 6 සිට 10 දක්වා දී ඇති වාක්‍ය හරි නම් '✓' ලකුණ ද වැරදි නම් 'x' ලකුණ ද ඉදිරියෙන් ඇති වරහන තුළ යොදන්න.

(06) වායුගෝලය පෘථිවි තලයේ සිට කිලෝමීටර 900 - 1200ත් දක්වා ඉහළට විහිදේ. (   )

(07) සූර්යාගෙන් පොළෝ තලයට එන අහිතකර පාරජම්බුල කිරණ, ඕසෝන් වියන මගින් අවශෝෂණය කර ගනියි. (   )

(08) ''කැසිටා නම් වූ පොකිරිස්සන් ඇති කිරීමේ නව තාක්‍ෂණික ක්‍රමය'', උතුරු පළාතේ ක්‍රියාත්මක වූ ව්‍යාපෘතියකි. (   )

(09) ශ්‍රී ලංකාවේ ජන සංඛ්‍යාවේ වැඩිහිටියන්ගේ ප්‍රමාණය වාර්ෂිකව වැඩි වෙමින් පවතී ( )

(10) ලෝකයේ විශාලතම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථානය පිහිටා ඇත්තේ ඉන්දියාවේ ය. ( )

g **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා I, II තීරු ගළපා I තීරුවේ ප්‍රකාශයට ගැළපෙන ඉංග්‍රීසි අක්ෂරය II තීරුවෙන් තෝරා වරහන් තුළ ලියා දක්වන්න.**

| | I තීරුව | | II තීරුව |
|---|---|---|---|
| (11) | ටයිගා හෙවත් කේතුධර වනාන්තර තිබේ. | ( ) | A - මධ්‍යම ආසියාව |
| (12) | ප්‍රධාන පෙළේ කාර්මික රටවල් කිහිපයක් පිහිටා ඇත. | ( ) | B - උතුරු ආසියාව |
| (13) | මීනැන්, මීකොං, ඉරවඩී වැනි ගංගා අයත් වෙයි. | ( ) | C - නැගෙනහිර ආසියාව |
| (14) | කඳුවලින් වට වූ උස් සානු හා තැනිතලා පිහිටා ඇත. | ( ) | D - නිරිත දිග ආසියාව |
| (15) | වියළි කාන්තාර ලක්ෂණ ඇත. | ( ) | E - ගිනිකොණ දිග ආසියාව |

g **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තිත් ඉරි මත ලියා දක්වන්න.**

(16) මැද පෙරදිග රටවල් ප්‍රබල ලෙස නියෝජනය කරමින් තෙල් මිල පාලනය කිරීම සඳහා .................................... සංවිධානය පිහිටුවාගෙන ඇත.

(17) ආසියාවේ දිගම ගංගාව ..................................... ගංගාව වේ.

(18) ශ්‍රී ලංකාවේ උසම බහු සන්නිවේදන ජාල කුළුන ............................ දිස්ත්‍රික්කයේ ''කොකාවිල්'' හි ඉදිකර ඇත.

(19) වර්ෂ 2050 වන විට ලෝකයේ රටවල් 66කට උග්‍ර ජල හිඟයකට මුහුණ දීමට සිදු වන බව ......................................... සංවිධානය මගින් ඇස්තමේන්තු වලට අනුව අනුමාන කරනු ලැබේ.


(20) ශ්‍රී ලංකාව තුළ පිහිටි රාජ්‍ය අංශයේ එකම රසායන ද්‍රව්‍ය කර්මාන්ත ශාලාව උතුරු පළාතේ .................................... හි පිහිටා ඇත.

මුළු ලකුණු (2 x 20 = 40)

## II කොටස

g **පළමු ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න 05කට පිළිතුරු සපයන්න.**

(01) ආසියාවේ විවිධ කලාප දැක්වෙන සිතියම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.




(i) ආසියාවේ සීමා ලියා දක්වන්න.

උතුරින් -

දකුණින් -

නැගෙනහිරින් -

බටහිරින් -

(ලකුණු 1 x 4 = 4)

(ii) A හා B අක්ෂරවලින් පෙන්නුම් කරන ආසියානු කලාප 2ක නම් කරන්න. (ලකුණු 1 x 2 = 2)

(iii) යැංසිකියැං, සිකියැං, හොවැංහෝ යන ප්‍රධාන ගංගා පිහිටි ආසියානු කලාපය නම් කරන්න. (ලකුණු 2)


(iv) සිතියමේ දැක්වෙන කලාප අතරින් C හා D ජනාධික කලාප දෙක නම් කරන්න. (ලකුණු 2)

(v) නැගෙනහිර ආසියානු කලාපයට අයත් ප්‍රධාන පෙළේ කාර්මික රටවල් 02ක් නම් කරන්න. (ලකුණු 2)

(vi) X හා Y අක්ෂරවලින් පෙන්නුම් කර ඇති මුහුදු 02ක පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 2)

(vii) ආසියානු කලාපය තුළ දැකිය හැකි ප්‍රධාන දේශගුණ වර්ග 02ක් නම් කරන්න. (ලකුණු 2)

(02) මිනිසාට ජලයෙන් ඇති ප්‍රයෝජන මෙමගින් දැක්වේ.




(i) A, B, E, F පින්තූරවලින් දැක්වෙන මිනිසා ජලය ප්‍රයෝජනයට ගන්නා ආකාර මොනවා ද? (ලකුණු 4)

(ii) ජලය හිඟවීම නිසා ගෝලීය වශයෙන් ඇති විය හැකි ගැටලු 3ක් ලියන්න. (ලකුණු 3)

(iii) ජලය දූෂණය වීමට බලපාන හේතු 2ක් නම් කර, ජල දූෂණය වළක්වා ගැනීමට ගත හැකි එක් ක්‍රියාමාර්ගයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(03) (i) වායුගෝලයේ ඇති වායු වර්ග 2ක් ලියන්න. (ලකුණු 2)

(ii) වායුගෝලයෙන් ඇති ප්‍රයෝජන 2ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) (A) ඕසෝන් ස්තරය යනු කුමක් ද? (ලකුණු 1)

(B) ඕසෝන් ස්තරය විනාශ වීමට බලපාන හේතු 2ක් ලියන්න. (ලකුණු 2)

(C) ඕසෝන් වියන විනාශ වීමෙන් ඇති විය හැකි ප්‍රතිවිපාක 02ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(D) ඕසෝන් වියන රැකගැනීමට ගෝලීය මට්ටමින් ගොඩනඟාගෙන ඇති සම්මුතීන් 2ක් දක්වන්න. (ලකුණු 2)

(04) ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | 1. | | | 3. සු | | මි |
| 2. නි | | ව | | | | | |
| | | | | | | | |
| | | 5. වෙ | | | 6. ම | | 7. |
| | 8. වැ | | | | | | න් |
| | | | | | | | |
| | ම | | | | ල | | |
| | | ස | | 7. මි | | | න් |

**පහළට**

1. බදුල්ල හා මොණරාගල දිස්ත්‍රික් මෙම පළාතට අයත් වේ.
2. ශ්‍රී ලංකාවේ සුන්දර වෙරළ තීරයකි.
3. වර්ෂාව ඇතිවීමට මෙම කාලගුණික අංගය ද හේතු වේ.
5. අතීතයේ මෙම ප්‍රදේශයේ වෙල් ලක්ෂයක් පැවති බව කියැවේ.
6. මෑතක දී ඉදි වූ ජාත්‍යන්තර ගුවන්තොටුපලකි.
7. ඉන්දියන් සාගරයේ පිහිටි දූපතකි.
8. මධ්‍යම කඳුකරයේ පිහිටි සානුවකි.

**හරහට**

2. ශ්‍රී ලංකාවේ දකුණු පළාතින් මුහුදට වැටෙන ප්‍රධාන ගංගාවකි.
3. 2004 වසරේ ශ්‍රී ලංකාවට බල පෑ දරුණු ස්වාභාවික විපතකි.
5. ත්‍රිකුණාමල වරාය අතීතයේ සිට ම මෙම කාර්ය සඳහා භාවිතා කරයි.
7. ශ්‍රී ලංකාවේ ප්‍රධාන වශයෙන් අපනයන ඉපයුම් ලබාදෙන ඛනිජ වර්ගයකි.

(ලකුණු 1 x 11 = 11)

(05) (i) කොළඹ පුරවරයට අයත් දිස්ත්‍රික්ක තුන නම් කරන්න. (ලකුණු 3)

(ii) නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(a) ශ්‍රී ලංකාවේ අගනුවර වන්නේ කුමක් ද?

(b) ශ්‍රී ලංකාවේ ප්‍රධාන ජාත්‍යන්තර ගුවන් තොටුපල නම් කරන්න.


(c) කොළඹ නගරය ආශ්‍රිතව මුහුදට ගලා බස්නා ප්‍රධාන ගංගාව තෝරන්න.

(d) කොළඹ පුරවරයේ ජන ඝනත්වය වැඩිම දිස්ත්‍රික්කය කුමක් ද?

(කොළඹ, කළු ගඟ, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ, කටුනායක, කැලණි ගඟ) (ලකුණු 1 x 4 = 4)

(iii) වර්තමානයේ කොළඹ පුරවරය මුහුණපාන ප්‍රධාන ගැටලුවක් වන්නේ අවිධිමත් ලෙස කැලිකසල බැහැර කිරීමයි. මේ නිසා ඇති වී තිබෙන බලපෑම් 2ක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 4)

(06)




(i) ඉහත දැක්වෙන උතුරු පළාත් සිතියමේ අංක 1, 2, හා 3 ලෙස සඳහන් කර ඇති දිස්ත්‍රික්ක තුන නම් කරන්න. (ලකුණු 3)

(ii) උතුරු පළාත් ජනතාවගේ ආර්ථික කටයුතු 02ක් සඳහන් කරන්න. (ලකුණු 2)

(iii) පහත සඳහන් උතුරු පළාතේ ඇති යටිතල පහසුකම්වලට එක් උදාහරණය බැගින් ලියන්න.

(a) (1) වරාය -

(2) ගුවන් තොටුපල -

(3) උසස් අධ්‍යාපන ආයතන - (ලකුණු 3)

(b) වර්තමානයේ උතුරු පළාතේ සංවර්ධනය සඳහා ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති 03ක් නම් කරන්න. (ලකුණු 3)

(07) (i) ගැළපෙන අයුරින් යා කරන්න.

(a) ඩකා - සාහිත්‍ය

(b) සාර්ක් - නැමි කඳු

(c) හිමාලය - බංගලාදේශය

(d) අස්පර්ශ උරුම - දකුණු ආසියානු කලාපය (ලකුණු 4)

(ii) ආසියා කලාපයේ වෙළෙඳාම සම්බන්ධයෙන් පැන නැගී ඇති ගැටලු අවම කරගැනීම සඳහා පිහිටුවාගෙන ඇති සංවිධාන 02ක් නම් කරන්න. (ලකුණු 4)

(iii) මෙහි දැක්වෙන සංවිධානය සම්බන්ධව අසා ඇති තොරතුරු දක්වන්න.

* පිහිට වූ වර්ෂය
* සාමාජික රටවල් ගණන
* සංවිධානයේ ප්‍රධාන අරමුණ (ලකුණු 3)

Answer

සියලුම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
**Provincial Department of Education - NWP**

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව Provincial Department of Education

දෙවන වාර පරීක්ෂණය - 9 ශ්‍රේණිය - 2017

**Second Term Test - Grade 9 - 2017**

භූගෝල විද්‍යාව පිළිතුරු පත්‍රය

## I කොටස

(1) - 3
(2) - 1
(3) - 4
(4) - 2
(5) - 4
(6) - 3
(7) - 3
(8) - x
(9) - 3
(10) - x
(11) - B
(12) - C
(13) - E
(14) - A
(15) - D
(16) - ඔපෙක්
(17) - යැංසිකියැං
(18) - මුලතිව්
(19) - එක්සත් ජාතීන්ගේ
(20) - පරන්තන්
(ලකුණු 2 x 20 = 40)

## II කොටස

(01) (i) ආක්ටික් සාගරය
ඉන්දියන් සාගරය
පැසිපික් සාගරය
යුරෝපය හා රතු මුහුද (ලකුණු 4)

(ii) (a) උතුරු ආසියාව
(b) නිරිත දිග ආසියාව (ලකුණු 2)

(iii) නැගෙනහිර ආසියාව (ලකුණු 2)

(iv) C - දකුණු ආසියාව
D - නැගෙනහිර ආසියාව (ලකුණු 2)

(v) ජපානය, චීනය (ලකුණු 2)

(vi) X - රතු මුහුද
Y - කැස්පියන් මුහුද (ලකුණු 2)

(vii) නිවර්තන, වියළි, සෞම්‍ය, ශීත, තුන්ද්‍රා හා කඳුකර (ලකුණු 2)

(02) (i) A - පානය සඳහා
B - ජල පරිවහනය
E - කෘෂිකාර්මික කටයුතු
F - බලශක්ති උත්පාදනය
(ලකුණු 4)

(ii) දේශගුණික විපර්යාසය, කෘෂිකර්මය අඩාල වීම, කාන්තාරීකරණය
(ලකුණු 3)

(iii) * කෘෂි රසායන ද්‍රව්‍ය ජලයට මුසුවීම.
* කාර්මික අපද්‍රව්‍ය ජලයට මුදා හැරීම.
* කැලි කසල මුදා හැරීම. (ලකුණු 4)

(03) (i) නයිට්‍රජන්, ඔක්සිජන්, කාබන්ඩයොක්සයිඩ්
(ලකුණු 2)

(ii) ජීවීන්ගේ පැවැත්මට වර්ෂණ ක්‍රියාවලියට, ප්‍රභාසංශ්ලේෂණයට (ලකුණු 2)

(iii) (a) සූර්යාගේ අහිතකර පාරජම්බුල කිරණ අවශෝෂණය කරගන්නා වායුමය ස්තරය

(ලකුණු 1)

(b) * අහිතකර වායු මුදා හැරීම.

* පොසිල ඉන්ධන දහනය (ලකුණු 2)

(c) * දේශගුණ විපර්යාස

* බෝග ඵලදාව අඩුවීම.

* චර්ම රෝග (ලකුණු 2)

(d) * මොන්ට්‍රියල්, වියානා, කියෝතෝ

(ලකුණු 2)

(04) **පහළට**

1. ඌව
2. නිලාවේලි
3. සුළං
5. වෙල්ලස්ස
6. මත්තල
7. අන්දමන්
8. වැලිමඩ (ලකුණු 7)

**හරහට**

2 . නිල්වලා
3. සුනාමි
5. වෙළෙඳාම
7. මිනිරන් (ලකුණු 4)

(05) (i) කොළඹ, කළුතර, ගම්පහ (ලකුණු 3)

(ii) (a) ශ්‍රී ජයවර්ධපුර කෝට්ටේ

(b) කටුනායක

(c) කැලණි ගඟ

(d) කොළඹ (ලකුණු 4)

(iii) ලෙඩ රෝග බෝවීම., ජල මූලාශ්‍ර විනාශ වීම, පරිසරය අපවිත්‍ර වීම.... (ලකුණු 4)

(06) (i) 1 - මන්නාරම, 2 - කිලිනොච්චිය

3 - වවුනියාව (ලකුණු 3)

(ii) ධීවර කර්මාන්තය, කෘෂි කර්මාන්තය, තල් ආශ්‍රිත නිෂ්පාදන (ලකුණු 2)

(iii) (a) 1 - කන්කසන්තුරේ

2 - පලාලි, වවුනියා

3 - යාපනය විශ්ව විද්‍යාලය, වවුනියා විශ්ව විද්‍යාලය (ලකුණු 3)

(b) * කර්මාන්ත නගා සිටුවීම.

* දුම්රිය මාර්ග ප්‍රතිසංස්කරණය

* යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම.

* අවතැන් වූවන් සඳහා පහසුකම් සැලසීම

(ලකුණු 3)

(07) (i) a - බංගලාදේශය

b - දකුණු ආසියා කලාපය

c - නැමි කඳු

d - සාහිත්‍ය (ලකුණු 4)

(ii) * දකුණු ආසියානු වරණීය වෙළෙඳ ගිවිසුම (SAPTA)

* දකුණු ආසියානු නිදහස් වෙළෙඳ ප්‍රදේශය (SAFTA)

(ලකුණු 4)

(iii) * 1997

* 07කි.

* කලාපයේ ආර්ථික සාමාජීය සහසම්බන්ධතාව සහ සහයෝගීතාවය වර්ධනය කිරීම.

(ලකුණු 3)